SLGURU.LK

# ශාන්ත පීතර විදුහල - කොළඹ 04

## මධ්‍ය වාර පරීක්ෂණ, පළමු වාරය - 2020

## 07 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

Virtue and Truth

කාලය: පැය 01

14/02/2020

### I කොටස

**01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ජන සමාජයේ කුඩාම සමාජ ඒකකය වනුයේ,

   i. පන්තිය ii. පවුල iii. පන්සල iv. පල්ලිය

2. පවුලේ සාමාජිකත්වය අනුව එය කොටස් _____ කට බෙදේ.

   i. 1 ii. 2 iii. 3 iv. 4

3. න්‍යෂ්ටික පවුලට අයත් සාමාජිකයෙක් නොවන්නේ,

   i. අම්මා ii. තාත්තා iii. මල්ලී iv. ආච්චි

4. අම්මාගේ තාත්තා මාගේ,

   i. බාප්පා ii. මාමා iii. සීයා iv. මහප්පා

5. පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංගයක් නොවන්නේ,

   i. සුහදශීලී බව ii. වංක බව
   iii. ස්වයංවිනය iv. අන්‍ය මත ගරු කිරීම

02. පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, වරහන් තුළ යොදන්න.

1. විස්තෘත පවුල යනු ඥාතීන් සමූහයකින් යුක්ත, පරම්පරා තුනක හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල් ඒකකයකි. ( )

2. පවුලේ සාමාජිකයන් ලෙස ජීවත් වීමේ දී අපට අත්වන ප්‍රයෝජනයක් ලෙස සම්ප්‍රදාය හා සිරිත් විරිත් ගරු කිරීමට හුරු වීම දැක්විය හැකිය. ( )

3. ඔබ සතු උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා, සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඇති කරගන්නා අභිමානය, ආත්මාභිමානයයි. ( )

4. වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනාගැනීම සඳහා DNA ව්‍යුහය පිළිබඳ පරීෂණය සමත් වේ. ( )

5. හොඳ මාධ්‍ය වැඩසටහන් ඔබගේ කාලය නාස්ති කර දැමීමකි. ( )

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

## II කොටස

**කෙටි පිළිතුරු ලියන්න.**

1. වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක ඒවායේ සාමාජිකත්වය අනුව බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

   i. _____ ii. _____

   **(ලකුණු 04)**

2. විස්තෘත පවුලට අයත් සාමාජිකයන් 5ක් නම් කරන්න.

   i. _____ ii. _____

   iii. _____ iv. _____

   v. _____ **(ලකුණු 10)**

3. පවුලට සාමාජිකයෙක් ලෙස ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන 5ක් නම් කරන්න.

   i. _____ ii. _____

   iii. _____ iv. _____

   v. _____ **(ලකුණු 10)**

4. ඔබ ජයගැනීමට බලාපොරොත්තු වන ජීවන අරමුණු 03 ක් නම් කරන්න.

   i. _____ ii. _____

   iii. _____ **(ලකුණු 06)**

5. ඔබ සතු හොඳ ගති ලක්ෂණ 5ක් ලියන්න.

   i. _____ ii. _____

   iii. _____ iv. _____

   v. _____ **(ලකුණු 10)**

6. යහපත් ගතිගුණ ඔබ තුළ වර්ධනය කිරීම සඳහා පාසලේ ක්‍රියාත්මක වන වැඩසටහන් 5ක් ලියන්න.

   i. _____ ii. _____

   iii. _____ iv. _____

   v. _____ **(ලකුණු 10)**

7. ක්‍රීඩා වල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග 5ක් සඳහන් කරන්න.

   i. _____ ii. _____

   iii. _____ iv. _____

   v. _____ **(ලකුණු 10)**

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

“An investment in knowledge pays the best interest.” — Benjamin Franklin




Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only